# පුරප්පාඩු දැන්වීමයි
# මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ
## නියෝජ්‍ය අධ්‍යක්ෂ

මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දැනට පුරප්පාඩුව පවතින මාතලේ සහ මහනුවර නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා පත් කිරීමට දැනට මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වන ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය**

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියට අයත් අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පිළිවෙලින් ඉහත පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ. (අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

**02. අවශ්‍ය සුදුසුකම්**

i. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම.

ii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතුය.

iii. දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාල නොවේ.

iv. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන:** සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**03. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.03.31 වන දින හෝ ඊට පෙර ලැබෙන ලෙස මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ, මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව **" ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර "** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් , අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ. (ආදර්ශ අයදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.ඒ.ඩී.ඩබ්ලිව්.දයානන්ද,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 පෙබරවාරි මස 22 වැනි දින.
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලයේදීය

**මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අදාල ලකුණු නිර්ණායක**

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු |
|---|---|
| **01. <u>ජ්‍යෙෂ්ඨතාවය</u>**<br>උපරිම ලකුණු ලැබෙන සේ සේවා කාලයට සමානුපාතිකව ලකුණු ලබා දේ.<br>(ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියට පත්වූ දින සිට වැඩිම සේවා කාලය ඇති අයැදුම්කරුට උපරිම ලකුණු ලැබෙන සේ සේවා කාලයට සමානුපාතිකව ලකුණු ලබා දේ) | 40 |
| **02. <u>කුසලතාවය</u>**<br>I. <u>වාචික පරීක්ෂණය</u><br>I.i මූල්‍ය කළමනාකරණය හා පරිපාලන කටයුතු පිළිබඳ දැනුම - (ලකුණු 15)<br>I.ii සංවර්ධන කටයුතු පිළිබඳ අවබෝධය - (ලකුණු 10) | 25 |
| II. පශ්චාත් උපාධි - (ලකුණු 05) / පශ්චාත් උපාධි ඩිප්ලෝමා - (ලකුණු 03) | 05 |
| III. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය යන ක්ෂේත්‍රයන්ට අදාල වන පරිදි නිර්මාණශීලීත්වය හා වෘත්තීය සංවර්ධනය - (ලකුණු 05)<br>(ප්‍රකාශයට පත්කර ඇති වෘත්තීය මට්ටමේ ප්‍රකාශන, විෂය ක්ෂේත්‍ර හා ඉන් ඔබ්බට සිදු කර ඇති සුවිශේෂී වූ නිර්මාණශීලී වැඩසටහන්, පුවත්පත්, සඟරා වලට සපයා ඇති ලිපි, සංවර්ධන ව්‍යාපෘති හා නව තාක්ෂණික සොයා ගැනීම් සම්බන්ධ තොරතුරු සනාථ කෙරෙන ලිපි ලේඛන වාර්තා ආදිය - (උපාධිය හෝ පශ්චාත් උපාධිය සඳහා කරන ලද පර්යේෂණ හැර) | 05 |
| IV. ජාතික මට්ටමේ ජයග්‍රහණ සහ 230 'බී' ආකෘතියේ ප්‍රශංසා ලිපි - (ලකුණු 05) | 05 |
| V. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය - (ලකුණු 05) | 05 |
| VI. පසුගිය වසර 05 තුල කාර්ය සාධන වාර්තා පදනම් කර ගෙන<br>විශිෂ්ඨ - වසරකට ලකුණු 03 බැගින්<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල - වසරකට ලකුණු 02 බැගින්<br>සතුටුදායක - වසරකට ලකුණු 01 බැගින්<br>(උපරිම ලකුණු 15) | 15 |
| එකතුව | 100 |

**(ආදර්ශ අයැදුම්පත්‍රය)**

**මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ**

**නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා අයැදුම්පත්‍රය**

01. මුලකුරු සමඟ නම - ……………………………………………………………………... (මයා/මිය/මෙනවිය)

02. i. දැනට දරණ තනතුර - ……………………………………………………………………...

ii. සේවය හා ශ්‍රේණිය - ..……………………………………………………………………….

iii. දැනට සේවය කරන ආයතනය හා ලිපිනය -……………………………………………………..

03. පෞද්ගලික ලිපිනය - ……………………………………………………………………...

04. ස්ත්‍රී/පුරුෂ භාවය - ……………………………………………

05. i. උපන්දිනය - ……………………………………………

ii. 2021.03.31 දිනට වයස -…………………………………………...

06. ජාතික හැඳුනුම්පත් අංකය -……………………………………………

07. දුරකථන අංකය - ……………………………………………

i. පෞද්ගලික -…………………………  ii. රාජකාරි -……………………….

08. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියට උසස් වූ දිනය - …………….

09. අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2021.03.31) සක්‍රිය සේවා කාලය - අවුරුදු ……මාස……දින…..

10. හදාරා ඇති දේශීය / විදේශීය පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර -

| හැදෑරූ පුහුණු පාඨමාලාව | ආයතනය | කාල සීමාව | දේශීයද , විදේශීයද යන වග |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. රාජ්‍ය සේවයේ මුල්පත්වීමේ සිට 2021.03.31 දින දක්වා සේවා කාලයට අදාළ විස්තර -

| දරණ ලද තනතුර | අයත් සේවාව | ආයතනය | කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට දක්වන ලද ''කුසලතාවය'' පිළිබඳ විස්තර -

i. වාර්ෂික කාර්යය සාධන ඇගයුම

අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2021.03.31) පූර්වාසන්න වසර 05 තුළ ලබා ඇති කාර්යය සාධන මට්ටම පිළිබඳ විස්තර

(අදාල නොවන වචන කපා හරින්න)

| වර්ෂය | ලබා ඇති කාර්යය සාධන මට්ටම |
|---|---|
| 2016 | විශිෂ්ය / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල / සතුටුදායක |
| 2017 | විශිෂ්ය / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල / සතුටුදායක |
| 2018 | විශිෂ්ය / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල / සතුටුදායක |
| 2019 | විශිෂ්ය / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල / සතුටුදායක |
| 2020 | විශිෂ්ය / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල / සතුටුදායක |
| 2021 | විශිෂ්ය / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල / සතුටුදායක |

ii. ප්‍රකාශන

| පළ කරන ලද ප්‍රකාශනය | අදාල කාණ්ඩය |
|---|---|
| | |

iii.ප්‍රශංසා හා සම්මාන

(අ) ලබා ඇති ප්‍රශංසා පිළිබඳ විස්තර -

( “ පොදු 230බී ” ආකෘතිය මඟින් ලබා දී ඇති ප්‍රශංසා සඳහා පමණක් මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.)

| ලබා ඇති ප්‍රශංසාව | ප්‍රශංසාව ලැබුනේ | | කුමන ක්ෂේත්‍රයට අදාල කාර්යයක් වෙනුවෙන් ප්‍රශංසාව හිමිවූයේද යන්න |
|---|---|---|---|
| | කාගෙන්ද යන්න | වර්ෂය | |
| | | | |

මා හට විරුද්ධව දැනට විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන බවත්, අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ සඳහන් I හෝ II වන උපලේඛනය යටතේ සිදුකරනු ලැබූ වරදකට දඬුවම් නොලැබූ අයෙකු බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි ඒවා බවත් මෙයින් සහතික කරමි.

දිනය - .........................

.......................................................

අයැදුම්කරුගේ අත්සන

---

**<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :</u>**

.............................................................මයා/මිය විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුවෙන් පරීක්ෂා කර බැලූ බවත්, ඒ අනුව එම තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම නිලධාරියා/නිලධාරිනිය විසින් 2021.03.31 දිනට පූර්වාසන්න පස් වසරක කාලසීමාව තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, කිසිදු විනයානුකූල දඬුවමකට ලක් නොවූ බවත්, මෙම අයට විරුද්ධව යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් හා ඉදිරියේදී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවත් සහතික කරමි. නිලධාරියා/නිලධාරිනිය තෝරා ගනු ලැබුවහොත් නිදහස් කිරීමට එකඟ වෙමි.

...............................................

දිනය

...................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම

නිලමුද්‍රාව

---

**<u>කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :</u>**

...............................................

දිනය

...................................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන

නම

නිලමුද්‍රාව

---

**<u>මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :</u>**

...............................................

දිනය

...................................................

පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන

නම

නිලමුද්‍රාව